# COVID 19 සති පාසල සබරගමු පළාත - 3 වන සතිය

**9 ශ්‍රේණිය භූගෝල විද්‍යාව**

ඒකකය 02- ශ්‍රී ලංකාවේ භූ දර්ශකය

ක්‍රියාකාරකම 3 - ශ්‍රී ලංකාවේ භෞතික භූ දර්ශනයේ ප්‍රධාන සංරචක අතර ජලවහනය හා දේශගුණය හඳුනා ගනිමු

හැඳින්වීම -ජල සම්පතින් පොහොසත් ශ්‍රී ලංකාව තුළ ගංගා රාශියක් නිත්‍ය හා ඍතුමය ගංගා වශයෙන් ගලා බසී. දේශගුණය ගත් විට උෂ්ණත්වය හා වර්ෂාපතනය එහිදී වැදගත් වන අතර එහි ප්‍රාදේශීය වශයෙන් පවතින වෙනස්කම් හැදෑරීමද මෙහිදී වැදගත් වේ.

ගුණාත්මක යෙදවුම් -භූගෝල විද්‍යාව පෙළ පොත, සටහන් පොත ,පෑන් ,පැන්සල්

ක්‍රියාකාරකම් සඳහා සඳහා සිසුන්ට උපදෙස් -

*පියවර 01 - 9 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළ පොතේ පිටු අංක 28 -37 දක්වා සාවධානව කියවා ගන්න

*පියවර 02- භූගෝල විද්‍යාව සටහන් පොත ගෙන පැවරුම් අංක 2 ප්‍රශ්ණාවලිය අවසන් වූ තැනින් පටන් ගෙන පිළිතුරු සපයන්න
*පිළිතුරු ලිවීමට පෙර අදාළ ප්‍රශ්නය ලිවීම අනිවාර්ය වන අතර ප්‍රශ්නය ළඟම අදාළ පිළිතුරු ලිවීම වඩාත් යෝග්‍ය වේ.
*පිළිතුරු ලිවීමට පෙළ පොතේ පිටු අංක 28 -37 දක්වා උපකාර කර ගන්න.

ප්‍රශ්නාවලිය

1. නිත්‍ය ගංගා හා ඍතුමය ගංගා හඳුන්වන්න.
2. ශ්‍රී ලංකාවේ සමස්ත ජල වහන රටාව කුමන ආකාර වේද?
3. කාලගුණය හා දේශගුණය යන්න අර්ථ දක්වන්න.
4. ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තියේ වෙනස්කම් කෙරෙහි බලපාන සාධක 4 කුමක්ද?
5. භූමියේ උස වැඩි වන විට උෂ්ණත්වය අඩුවීම කෙසේ හැදින්වේද?
6. ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය ඇසුරු කරගෙන පහත වගුව සම්පූර්ණ කරන්න .(පිටපත් කරගන්න)

| වර්ෂාපතන ක්‍රමය | ලැබෙන කාලය | ලැබෙන පෙදෙස |
|---|---|---|
| | | |

පසු වැඩ -ශ්‍රී ලංකා ආකෘති සිතියමක පහත දැක්වෙන ගංගා ද්‍රෝණි ලකුණුකර නම් කරන්න. මහවැලි ගඟ ,කැලණි ගඟ ,මල්වතු ඔය ,වලවේ ගග ,මා ඔය ,දැදුරුඔය ,කුඹුක්කන් ඔය ,ගිංගඟ ,මැණික් ගඟ ,නිල්වලා ගඟ

*ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය ආශ්‍රිතව සිදුවන ආපදා තත්ත්වයන් පිළිබඳ විස්තර හා පින්තූර ඇතුළත් කරමින් බිත්ති පුවත්පතකට ලිපියක් සකස් කරන්න .

සැකසුම - එම් .බී නදීරා දිල්හානි - භූගෝල විද්‍යාව ආචාර්ය-ර/නිවි/කෙහෙල්ඕවිටිගම විද්‍යාලය

# COVID 19 සති පාසල සබරගමු පළාත -3 වන සතිය

# 9 ශ්‍රේණිය ඉතිහාසය

ඒකකය 03-ශ්‍රී ලංකාවේ ඇති වූ ආගමික හා ජාතික පුනර්ජීවනය

පැවරුම් අංක 03- ක්‍රියාකාරකම් අංක 03- ශ්‍රී ලංකාවේ ඇති වූ හින්දු හා ඉස්ලාම් පුනර්ජීවනය

- ශ්‍රී ලංකාවේ ඇතිවූ මිෂනාරි ව්‍යාපාරයේ ක්‍රියාමාර්ග නිසා බෞද්ධාගම මෙන්ම හින්දු හා ඉස්ලාම් ආගම්ද එම සංස්කෘතීන්ද තර්ජනයට ලක්විය. ඒ තුළ එම ආගමික නායකයන් සිය ආගම් හා සංස්කෘතීන් රැකගැනීමට ගෙනගිය ක්‍රියාමාර්ග පිළිබඳ මෙහිදී විමසා බැලේ.
- ගුණාත්මක යෙදවුම් -ඉතිහාසය පෙළපොත/ඉතිහාසය සටහන් පොත/පෑන්/පැන්සල්
- ක්‍රියාකාරකම සඳහා සිසුන්ට උපදෙස් -
- පියවර 01 – 9 ශ්‍රේණියේ පෙළ පොතේ පිටු අංක 64 සිට 68 දක්වා කියවා ගන්න
- පියවර 02 - ඉතිහාසය සටහන් පොතේ පැවරුම් අංක 2 අවසන් වූ තැනින් පහතින් සපයා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.( පිළිතුරු ලිවීමට පෙළ පොතේ පිටු අංක 64 සිට 68 දක්වා උපකාර කරගන්න./ පිළිතුරු ලිවීමට පෙර අදාළ ප්‍රශ්නය ලිවීම අනිවාර්ය වේ. )

ප්‍රශ්නාවලිය-

1. මෙරට හින්දු ආගම තර්ජනයක් වෙමින් මිෂනාරි ව්‍යාපාරය පැතිර ගිය ප්‍රධාන පෙදෙස කුමක්ද?
2. හින්දු පුනර්ජීවනයට ගත් ක්‍රියාමාර්ග හතරක් ලියා දක්වන්න .
3. හින්දු ආගමික නායකයින් තිදෙනෙකු දක්වන්න.
4. ආරුමුග නාවලර් තුමාගේ ජාතික සේවාවන් ලියා දක්වන්න.
5. ඉස්ලාම් පුනර්ජීවනයට නායකත්වය ගෙන කටයුතු කළේ කවුරුන්ද?
6. ඊජිප්තුවේ සිට මෙරටට පැමිණ ඉස්ලාම් ආගමික පුනරුදයට සහය සහය දැක්වූ පුද්ගලයා කවුරුන්ද? ඔහු පැමිණි වර්ෂය ලියා දක්වන්න.

පසු වැඩ- හින්දු හා ඉස්ලාම් ආගමික පුනර්ජීවනයට නායකත්වය දුන් නායකයින් ලියා දක්වා ඔවුන් පිළිබඳ කෙටි සටහන් සකසන්න. (මෙම කෙටි සටහන් පාසල් ආරම්භයත් සමග තම විෂය භාර ගුරු භවතා ට ලබා දෙන්න)

ඒකකය 3 - ආගමික පුනර්ජීවනය හා පුනරුදය ඒකකය අවසන්. මෙම ඒකකය ආවරණය වන ලෙස සැකසුනු ප්‍රශ්න පත්‍රය සඳහා සූදානම් වන්න.

**සැකසුම - උදාර අරවින්ද -ර/නිවි/ කලවාන ජාතික පාසල -නිවිතිගල කලාපය**

# COVID 19 සති පාසල සබරගමු පළාත - 3වන සතිය

## 9 ශ්‍රේණිය පුරවැසි අධ්‍යාපනය

ඒකකය 03- ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

පැවරුම් අංක 3

ක්‍රියාකාරකම- 9.3.2 ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු සතු අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම හඳුනාගනිමු

හැඳින්වීම -ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුද්ගලයකුට යහපත් ජීවිතයක් ගත කිරීම සඳහා සමාජයෙන් හිමිවන පිළිගැනීම් අයිතිවාසිකම් වන අතර, අයිතිවාසිකම් භුක්ති විඳීමේදී අපෙන් සමාජයට ඉටුවිය යුතු කාර්යභාරය යුතුකම් ලෙස හැඳින්වේ.

ගුණාත්මක යෙදවුම් -පුරවැසි අධ්‍යාපන පෙළ පොත ,සටහන් පොත ,පෑන් ,පැන්සල්

ක්‍රියාකාරකම් සඳහා සඳහා සිසුන්ට උපදෙස් -
පියවර 01 -9ශ්‍රේණිය පෙළපොතේ පිටු අංක 73-76 දක්වා කියවන්න.

- පියවර 02 -සටහන් පොතේ පැවරුම් අංක 02,ප්‍රශ්නාවලිය අවසන් වූ තැනින් ,පහතින් සපයා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවීමට පෙර අදාළ ප්‍රශ්නය ලිවීම අනිවාර්ය වේ. )
- පිළිතුරු ලිවීමට පෙළ පොතේ පිටු අංක 73-76 දක්වා උපකාර කර ගන්න.

ප්‍රශ්නාවලිය

1.අයිතිවාසිකම් හා යුතුකම් මොනවාදැයි හඳුන්වන්න.
2. පුරවැසිශ්යකු සතු විය යුතු අයිතිවාසිකම් සාරාංශ ගත කරන්න.
3. ඔබෙන් සමාජයට ඉටුවිය යුතු යුතුකම් 10ක් ලියන්න.
4. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 28 වැනි ව්‍යවස්ථාවේ සඳහන් යුතුකම් තුනක් ලියන්න.
5. සෑම පුද්ගලයෙකුම අයිතිවාසිකම් භුක්ති විඳිය යුත්තේ යම් යම් සීමාවන්ට යටත්ව ය. ඒ අනුව රජය විසින් පනවා ඇති එවැනි සීමාවන් සඳහා උදාහරණ 3 ක් සපයන්න.

පසු වැඩ-
1. දෙමව්පියන්ගෙන් දරුවන්ට හා දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටු විය යුතු යුතුකම් 5 බැගින්ද ,
2. ගුරුවරුන්ගෙන් සිසුන්ට හා සිසුන්ගෙන් ගුරුවරුන්ට ඉටුවිය යුතු යුතුකම් 5 බැගින් ද දක්වා
3. එකී පාර්ශවවල යුතුකම් ඉටු කිරීමෙන් අයිතිවාසිකම් සුරක්ෂිත වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

පාසල ආරම්භ වූ වහාම මෙම අභ්‍යාස පුරවැසි අධයාපනය විෂය භාර ගුරු භවතා ට පෙන්වීමට සලස්වන්න

**ඉදිරිපත් කිරීම -ර/නිවි/පලාවෙල රත්නාකර විද්‍යාලයේ පුරවැසි අධයාපන විෂය භාර ආචාර්ය එම්.ඒ පත්මලතා මිය**